(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 388.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2014 අගෝස්තු මස 22 වැනි සිකුරාදා අ. භා. 1.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2689/'12

1\.
ගරු සජිත් ප්‍රේමදාස මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වන විට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සේවය කරන අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලබන වත්මන් ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

(iii) 2012 වර්ෂය සඳහා එම විශ්වවිද්‍යාලයට වෙන් කළ මුළු ප්‍රතිපාදනවල වටිනාකම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පවතින ඌනතාවයන් හා අඩුපාඩුකම් සම්පූර්ණ කිරීම සඳහා ඉහත වෙන් කළ ප්‍රතිපාදන ප්‍රමාණවත් වූයේද;

(ii) එම විශ්වවිද්‍යාලයේ දියුණුව උදෙසා සකස් කළ සංවර්ධන සැලැස්මක් තිබේද;

(iii) එසේ නම්, එම සැලැස්මට අයත් වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3307/'12

2\.
ගරු රවී කරුණානායක මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අද වන විට කොළඹ දිස්ත්‍රික්කයේ සේවය කරන සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iii) එම නිලධාරීන් ලබාදෙන සේවා කවරේද;

(iv) සමෘද්ධි සංවර්ධන නිලධාරියෙකුගේ මාසික වැටුප සහ ඉහත දිස්ත්‍රික්කයේ සේවය කරන සියලුම සමෘද්ධි නිලධාරීන්ගේ වැටුප් ගෙවීම සඳහා වැය කරන මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) කොළඹ දිස්ත්‍රික්කයේ සමෘද්ධි සංවර්ධන නිලධාරීන් ලබාදෙන සේවාව ප්‍රමාණවත්ද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3959/'13

3.

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර මහ නගර සභාව මගින් ගොහාගොඩ ප්‍රදේශයට බැහැර කරන කැළිකසළ සහ අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම පවරා ඇති ආයතනයේ නම සහ ලිපිනය කවරේද;

(ii) එම ආයතනයේ හිමිකරුගේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ නම් සහ ලිපිනයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ආයතනයේ හිමිකරු වෙනත් ආයතනයක තනතුරක් දරනු ලබන්නේද;

(iv) ඉහත (i) හි සඳහන් ආයතනය සමාගම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ හෝ වෙනත් ආයතනයක ලියාපදිංචි කර තිබේද;

(v) එසේ නම්, එම ආයතනවල හෝ ආයතනයේ නම සහ ලියාපදිංචි අංකය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ආයතනය සහ මහනුවර මහ නගර සභාව අතර ඇති කරගන්නා ලද බදු ගිවිසුමෙහි පිටපතක් සභාගත කරන්නේද;

(ii) එම බදු ගිවිසුමේ අඩංගු කොන්දේසි කවරේද;

(iii) ගිවිසුම අනුව ඉටු කර ඇති සහ පැහැර හැර ඇති කොන්දේසි කවරේද;

(iv) කොන්දේසි කඩකර ඇත්නම්, ඊට එරෙහිව ගන්නා ලද ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4174/'13

4.

ගරු රෝසි සේනානායක මහත්මිය,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2013 ජූලි මාසය අවසන් වන විට රාජ්‍ය විශ්වවිද්‍යාලවල සේවයේ නියුතුව සිටි එක් එක් අනධ්‍යයන කාර්ය මණ්ඩලයට අයත් සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) විශ්වවිද්‍යාල අනධ්‍යයන කාර්ය මණ්ඩල සේවකයින්ගේ බඳවා ගැනීම්වලට අදාළ අවම වැටුප් ප්‍රමාණය කවරේද;

(iii) එම අනධ්‍යයන සේවකයින්ගේ වැටුප් වර්ධක නිර්මාණය වී ඇති ආකාරය කවරේද;

(iv) අනධ්‍යයන සේවකයින්ගේ විවිධ වැටුප් තලයන්ට අදාළ දීමනා කවරේද;

(v) මේ වන විට අනධ්‍යයන කාර්ය මණ්ඩලයන්හි පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4466/'13

5.

ගරු අනුර දිසානායක මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010, 2011 සහ 2012 යන වර්ෂවලදී එක්සත් ජනපදයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය Hedges Strategies නමැති සමාගම සමග ගනුදෙනු කර තිබේද;

(ii) එසේ නම්, එම ගනුදෙනු සිදුවී ඇති දින වකවානු කවරේද;

(iii) එම ගනුදෙනු තුළින් ඉටුකර ගෙන ඇති කාර්යය හෝ කාර්යයන් කවරේද;

(iv) එමගින් ලැබී ඇති ප්‍රයෝජන කවරේද;

(v) එම කටයුතු වෙනුවෙන් කරන ලද ගෙවීම්වල වටිනාකම කොපමණද;

(vi) ඒ සඳහා මුදල් වෙන් කරනු ලැබූ වැය ශීර්ෂය කවරේද;

(vii) එම සමාගම සමග ගිවිසුම්වලට එළැඹී ඇත්නම්, එම ගිවිසුම් සභාගත කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4623/'13

6.

ගරු සුජීව සේනසිංහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රුසියානු තානාපති කාර්යාලයට ලබා දීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් පෞද්ගලික ඉඩමක් පවරා ගෙන තිබේද;

(ii) එම පවරා ගැනීම සිදු කර ඇති පදනම කවරේද;

(iii) රුසියානු තානාපති කාර්යාලය සඳහා ලබාදීමට නියමිත ඉඩමේ මුළු බිම් ප්‍රමාණය කොපමණද;

(iv) පෞද්ගලික ඉඩම් පවරා ගෙන වෙනත් ආයතන සඳහා විකිණීම සදාචාරාත්මක කටයුත්තක් වන්නේද;

(v) පවරා ගන්නා ලද ඉඩම්, පවතින නීතිය යටතේ පොදු කටයුත්තක් සඳහා හැර වෙනත් කාර්යයකට භාවිතා කිරීමට හැකියාව තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත ඉඩම් පවරා ගැනීමෙන් පසු එම ඉඩම්වල සිටි පදිංචිකරුවන්ට ලබා දී ඇති වන්දි මුදල කොපමණද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4634/'13

7.

ගරු පී. හැරිසන් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව ඉදිරියේදී විදේශ රටවලට සහල් අපනයනය කිරීමට බලාපොරොත්තු වන්නේද;

(ii) එසේ නම්, විදේශීය වෙළෙඳපොළට අවශ්‍ය සහල් නිපදවීමට අවශ්‍ය බිත්තර වී මේ වන විට රට තුළ නිෂ්පාදනය කරනු ලබන්නේද;

(iii) එසේ නම්, එම බිත්තර වී නිපදවනු ලබන ගොවිපළවල් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කර ඇති බාස්මතී වර්ග දේශීය වෙළෙඳපොළට ඉදිරිපත් කර තිබේද;

(ii) බාස්මතී වර්ග වගා කරනු ලබන ගොවීන්ගේ නිෂ්පාදන සඳහා වැඩි මිලක් ලබා දීමට කටයුතු කර තිබේද;

(iii) එසේ නම්, බාස්මතී සඳහා ගෙවනු ලබන මිල කොපමණද;

(iv) එසේ නිෂ්පාදනය කරනු ලබන බාස්මතී වර්ග මිලදී ගැනීම සඳහා රජයේ මධ්‍යස්ථානයක් ස්ථාපිත කර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4761/'14

8.

ගරු අශෝක් අබේසිංහ මහතා,— පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සුළු හා මධ්‍ය පරිමාණ කුකුළු ගොවිපළ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක වන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා 2012 වර්ෂයේ වෙන් කළ මුදල කොපමණද;

(iii) කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ලියාපදිංචි කර ඇති කුකුළු ගොවිපළ සංඛ්‍යාව කොපමණද;

(iv) ස්වයං රැකියාවක් ලෙස සුළු පරිමාණ කුකුළු ගොවිපළ සංවර්ධනය සඳහා වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4817/'14

9.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ඉදිවෙමින් පවතින දැදුරුඔය ජලාශ ව්‍යාපෘතියට සම්බන්ධ කර කුඩා ජල විදුලි බලාගාරයක් ඉදිකිරීමට යෝජිතව තිබේද;

(ii) එසේ නම්, ඒ තුළින් නිෂ්පාදනය කිරීමට අපේක්ෂා කරන විදුලි ධාරිතාව කොපමණද;

(iii) එකී ව්‍යාපෘතියට වැය වන මුළු මුදල කොපමණද;

(iv) මේ වන විට එම විදුලි ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබේද;

(v) එසේ නම්, ඉදිකිරීම් කටයුතු සිදු කරනු ලබන සමාගම කවරේද;

(vi) මෙලෙස නිපදවීමට අපේක්ෂිත විදුලි ධාරිතාව ලංකා විදුලිබල මණ්ඩලය විසින් මිලදී ගැනීමට ගිවිසුම් ගත වී තිබේද;

(vii) එසේ නම්, එක් විදුලි ඒකකයක් මිලදී ගැනීමට අපේක්ෂා කරන මුදල කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4907/'14

10\.
ගරු තිස්ස අත්තනායක මහතා,— පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහර බන්ධනාගාරය තුළ රඳවා සිටින මුළු රැඳවියන් සංඛ්‍යාව;

(ii) ඔවුන් අතරින් සැකකරුවන් ලෙස එහි රඳවා සිටින සංඛ්‍යාව;

(iii) සිරකරුවන් ලෙස රඳවා සිටින සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මහර බන්ධනාගාරයේ "එල්" සහ "එන්" යන රැඳවුම් ශාලා දෙක සැකකරුවන් රඳවා තැබීමට යොදා ගන්නා බවත්;

(ii) එම ශාලාවල අධික තදබදයක් පවතින බවත්;

(iii) එහි වැසිකිළි පහසුකම් සහ බීමට හා නෑමට අවශ්‍ය ජල පහසුකම් අවම මට්ටමක පවතින බවත්;

(iv) ඉහත තත්ත්වයන් හේතුවෙන් එම ශාලාවල රැඳවියන් ඉතා පීඩාකාරී තත්ත්වයකට පත්වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) මහර බන්ධනාගාරයේ රැඳවුම් ස්ථාන තුළ පවත්නා තදබදය අවම කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මහර බන්ධනාගාරයේ වත්මන් අධිකාරීවරයාගේ නම කවරේද;

(ii) එම බන්ධනාගාරය තුළ සේවය කරනු ලබන මුළු සේවක පිරිස කොපමණද;

(iii) මහර බන්ධනාගාරයේ අධිකාරීවරයා ඇතුළු සේවක පිරිස එහි රැඳවියන්ට අමානුෂික ආකාරයෙන් සලකන බවට වන චෝදනාවෙහි කිසියම් සත්‍යතාවයක් තිබේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

5028/'14

11\.
ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වෛද්‍ය ප්‍රතිකාර ලබා දීමේදී පෝෂණවේදියකු විසින් ඉටු කරනු ලබන කාර්යභාරය කවරේද;

(ii) සෞඛ්‍ය සේවය තුළ සිටිය යුතු පෝෂණවේදීන් සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වන විට රජයේ රෝහල්වල සේවය කරනු ලබන පෝෂණවේදීන් සංඛ්‍යාව කොපමණද;

(iv) රජයේ රෝහල් සඳහා අවශ්‍ය පෝෂණවේදීන් සංඛ්‍යාව මෙතෙක් බඳවා නොගැනීමට හේතු කවරේද;

(v) රෝගීන්ට වඩා හොඳ ප්‍රතිකාර සේවාවක් ලබාදීම සඳහා අවශ්‍ය පෝෂණවේදීන් සංඛ්‍යාව කඩිනමින් බඳවා ගැනීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2690/'12

12\.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොරටුව විශ්වවිද්‍යාලය ආරම්භ කරන ලද වර්ෂය කවරේද;

(ii) එම විශ්වවිද්‍යාලයේ නිර්මාතෘවරුන් කවුරුන්ද;

(iii) මේ වන විට එම විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලබන සිසුන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2012 වර්ෂය සඳහා මොරටුව විශ්වවිද්‍යාලයට වෙන් කළ මුදල කොපමණද;

(ii) එම මුදල එකී විශ්වවිද්‍යාලයට 2011 වර්ෂයේදී වෙන්කළ මුදලට සාපේක්ෂව අඩු වී හෝ වැඩිවී ඇති ප්‍රමාණය කොපමණද;

(iii) මොරටුව විශ්වවිද්‍යාලයේ සිසුන්ට ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීම සඳහා ප්‍රමාණවත් මුදලක් වෙන්කරදී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3308/'12

13\.

ගරු රවී කරුණානායක මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දේශපාලනඥයින් හෝ රජයේ සේවකයින් විදේශගතවූ අවස්ථාවලදී ඔවුන්ගේ වියදම් පියවීම සඳහා අදාළ රටවල ශ්‍රී ලංකා තානාපති කාර්යාල සතු අරමුදල්වලින් මුදල් වියදම් කිරීමට සිදුවන්නේද;

(ii) එසේ නම්, එම වියදම් පියවීම සඳහා පසුගිය වර්ෂ හය ඇතුළත අදාළ තානාපති කාර්යාල විසින් වැයකරන ලද මුළු මුදල වාර්ෂික පදනමින් කොපමණද;

(iii) උක්ත ගෙවීම් සිදුකරන ලද කාර්යයන් මොනවාද;

(iv) එම වියදම් දැරීමට සිදුවූ හේතු පෞද්ගලික හේතුන්ද; නැතහොත්, රාජකාරීමය හේතුන්ද;

(v) එකී වියදම් දරන ලද්දේ පෞද්ගලික හේතු මත නම්, එම ගෙවීම් සිදු කරන ලැබුවේ කවර අය සඳහාද;

(vi) එම ගෙවීම් සිදු කරන ලද දිනයන් සහ ගෙවීම්වලට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3960/'13

14\.

ගරු බුද්ධික පතිරණ මහතා,— පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලුණුවිල පොල් පර්යේෂණ ආයතනය යටතේ ඇති වතුවල සිටි කිරි ගවයින් 300ක් පමණ ව්‍යාජ ටෙන්ඩර් කැඳවීමක් සිදුකරමින් මස් සඳහා විකුණා ඇති බවත්;

(ii) එම ගවයින් අතර කිරි එළදෙනුන්, වසුපැටවුන් සහ ගැබ්බර එළදෙනුන් සිටි බවත්;

(iii) රජයේ නීති රීති අනුව මස් පිණිස අලෙවි කළ හැක්කේ පිරිමි ගවයින් (ගොනුන්) පමණක් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත පරිදි විකුණා ඇති එක් එක් ගවයාගේ වයස හා බර වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම ගවයින් මිලදී ගෙන ඇති පුද්ගලයින්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් ගවයින් අලෙවි කිරීම සිදුකොට ඇත්තේ පවතින නීති රීතිවලට පටහැනිව බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එම වංචනික ගනුදෙනුව පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4178/'13

15.

ගරු රෝසි සේනානායක මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 වර්ෂයේ ඇතිවූ z-score අර්බුදය හේතුවෙන් අධ්‍යාපන විද්‍යා පීඨවලට සිසුන් ඉල්ලුම් පත් යොමු කිරීමේදී ගැටලුකාරී තත්ත්වයක් උද්ගත වූ බව දන්නේද;

(ii) අධ්‍යාපන විද්‍යා පීඨවලට සිසුන් බඳවා ගැනීම්වලට අදාළව ගැසට් නිවේදන නිකුත් කර තිබේද;

(iii) එම ගැසට් නිවේදනයන්ගේ අංක හා දිනයන් කවරේද;

(iv) එම ගැසට් නිවේදනයන්හි සඳහන් කරුණු කවරේද;

(v) මේ වන විට අධ්‍යාපන විද්‍යා පීඨ වෙනුවෙන් ලැබී තිබෙන ඉල්ලුම් පත් සංඛ්‍යාව කොපමණද;

(vi) ඒ අතරින් සම්මුඛ පරීක්ෂණවලට කැඳවීම් ලැබූ සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## ශෝක ප්‍රකාශ යෝජනා

1.

අභාවප්‍රාප්ත ගරු (මහාචාර්ය) ඒ. වී. සුරවීර මහතා, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

කාලාවරෝධ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2014 අගෝස්තු මස 07) [1]

*2.

පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*3.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යොන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 3),— 2014.08.05 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යොන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ චෙක් ජනරජයේ ආණ්ඩුව අතර 2011 මාර්තු මස 28 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

ප්‍රවාහන අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 5 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය සහ 19 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව,

2013 ජුලි 31 දිනැති අංක 1821/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.11.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*7.

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා,— සේවක අර්ථසාධක අරමුදල පනත යටතේ නියෝග,— කලින් කල සංශෝධිත 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල පනතේ 46 වැනි වගන්තිය යටතේ කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 මැයි 13 දිනැති අංක 1810/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.06.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වූ) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

*10.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2011,— 1999 අංක 38 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලද විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ 2013.09.04 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2013.09.13 දින සලකා බලන ලදී.)

*11.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2011,— 1983 අංක 54 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලද ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ 2013.11.22 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.07 දින සලකා බලන ලදී.)

*12.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව - 2011,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30 (2) වගන්තිය යටතේ 2013.10.10 දින ඉදිරිපත් කරන ලද 2011 ජනවාරි 01 දින සිට 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

13.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

14.

රණ කලා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

15.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

16.

අල් ජමියාතුල් හ්හව්සියා (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

17.

ජයන්තිපුර සුභසාධක සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

18.

මෙත් සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

19.

ශ්‍රී ලංකා කෘෂිකර්ම ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

20.

ජයරත්න පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

21.

ජම් ඉය්යතුස් සහ්වා අල් - හයිරිය්යා (ජස්කා) (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

22.

එම්. කේ. ඒ. ඩී. එස්. ගුණවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

[1]

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---